# ශුද්ධ වූ ජනවන්දනාව (CONSTITUTION ON THE SACRED LITURGY - *SACROSANCTUM CONCILIUM*) පිළිබඳ දෙවන වතිකාන මන්ත්‍රණ සභා ව්‍යවස්ථාව: ඉතිහාස අධ්‍යයන ගවේෂණයක්

පී. ඩී. අයි. මධුෂානි

බටහිර සම්භාව්‍ය සංස්කෘතිය හා ක්‍රිස්තියානි සංස්කෘතිය අධ්‍යයන අංශය

පූර්වෝක්ත පර්යේෂණ මාතෘකාව අධ්‍යයනය කිරීම අරභයා දෙවන වතිකාන මන්ත්‍රණ සභාව පිළිබඳ විද්වතකු වන ජී. ඇල්බෙරිගෝ (G. Alberigo) විසින් සම්පාදිත *History of Vatican II* නමැති ග්‍රන්ථ වෙළුම් පහ ප්‍රාථමික මූලාශ්‍රයක් (Primary Source) ලෙස භාවිත කෙරේ. එහි සඳහන් දෙවන වතිකාන මන්ත්‍රණ සභාව විසින් ඉදිරිපත් කරන ලද **ශුද්ධ වූ ජනවන්දනාව පිළිබඳ ව්‍යවස්ථාව** සකස් වූ ආකාරය හා එයට පසුබිම් වූ කරුණු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදු කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වේ.

ජනවන්දනාව යනු නමස්කාරයෙන් දෙවියන් දැන ගැනීම හා දෙවියන්ට තුති පිදීමයි. ජනවන්දනාවේ කේන්ද්‍රය ක්‍රිස්තුන් වහන්සේ ය. එහි දී සැමරෙන්නේ දෙවියන් වහන්සේගේ ගැලවීමදායක මැදිහත්වීම වචනයෙන් හා ක්‍රියාවෙන් සිහි කරමින් ජේසුතුමන්ගේ දූත සේවය, මරණය හා උත්ථානය පරිස්මරණය කිරීම ය. ජනවන්දනාවේ හරය සැම කිතුනුවෙකු ම අනුන් සඳහා දිවි ගෙවීමට පෙළඹවීම ය. ජනවන්දනාව පිළිබඳ ව්‍යවස්ථාව ස්වභාෂාවලින් වත්පිළිවෙත් සිදු කිරීමට නිර්දේශ කළ අතර ඒ ඒ රටවල සංස්කෘතීන් හා සිරිත් විරිත් අනුව කතෝලික ජනවන්දනාව සකසා ගැනීමට මහඟු අවස්ථාවක් ඉන් සැලසිණ.

මෙහි පර්යේෂණ ගැටලුව වන්නේ ජනවන්දනාත්මක වත්පිළිවෙත් ක්‍රම දේශානුරූපීකරණය කිරීමට දෙවන වතිකාන මන්ත්‍රණ සභාවෙන් අවස්ථාව ලබා දුන්න ද සිරිලක් කිතු සසුන තුළ මෙම යෝජනා කොතෙක් දුරට ක්‍රියාත්මක වූයේ ද යන්න විමසීම යි.

මෙම නිබන්ධයට අදාළ දත්ත රැස් කර ගැනීම සඳහා යොදා ගත් පර්යේෂණ ක්‍රමවේද වන්නේ ලේඛන, ඓතිහාසික හා මූලාශ්‍රය විමර්ශනයන් ය. ජී. ඇල්බෙරිගෝ විසින් සම්පාදිත *History of Vatican II* නමැති ග්‍රන්ථ වෙළුම් පහට අමතරව විශ්වකෝෂ, ශාස්ත්‍රීය ග්‍රන්ථ හා ලිපි, අන්තර්ජාලය ආශ්‍රයෙන් ද දත්ත ගොනු කොට තිබේ.

**මූලික පද:** ජනවන්දනාව, දේශානුරූපී, එඬේරික ව්‍යවස්ථාව